# කොම්පෝස්ට්: ගෙවතු වගාවට අත්වැලක්

නිතර වගා කිරීමේදී පසේ ස්වාභාවික පොහොර ගුණය නොපවතී. මේ නිසා ස්වාභාවික පොහොර ගුණය පවත්වා ගැනීමට හා ඉක්මනින් පැලෑටි වැඩීමට අවශ්‍ය පොහොර පසට යෙදිය යුතුවේ. එලවළු වගාවන්හිදී පැලෑටි කොටස්, පසට යෙදීමට අවශ්‍ය වන්නේ එබැවිනි. ඒ නිසා ගොම් පෝර, එළු පෝර, කොම්පෝස්ට්, කොල පෝර හෝ හොඳින් දිරූ කුකුල් පෝර සෑම කන්න යක් පාසාම යෙදීම ඉතා වැදගත් වේ. වැලි සහිත කොටුවලට මෙම ද්‍රව්‍ය, නොවරදවාම යෙදීම අවශ්‍යවේ. එමගින් ජලය රඳා ගැනීමේ ශක්තිය වැඩිවේ පෝෂණීය ගුණය වැඩිවේ. මැටි සහිත පස්වල මේවා යෙදීමෙන් ජලවහනය හා පාංශු වාතනය දියුණු කරයි. මෙම ද්‍රව්‍ය වැඩෙන පැලෑටි වලට අවශ්‍ය, පොහොර සපයන අතර සෑම සරු පසකම අඩංගු විය යුතු සාධකයකි. මෙවැනි ඉන්ද්‍රියවත් ද්‍රව්‍ය එකතු කිරීමෙන් හියුමස් නමැති ද්‍රව්‍ය මතු පසතුළ සෑදේ. සත්ත්ව හා පැලෑටි ශේෂ කුණු වීමෙන් ඇතිවන මෙය දුඹුරු පැහැයෙන් යුත් කුඩු විශේෂයක් වේ. හියුමස් නොමැති පස් නිසරු පස් ලෙස සලකන අතර, එවැනි පස් තද ඇලෙන ගති යෙන් හෝ වියලි, බුරුල් ගතියකින් යුතුවේ. කොම්පොස්ට් යනු පසට යෙදිය හැකි ඉතාමත් වටිනා ඉන්ද්‍රිය වත් පොහොරකි. ඉවතලන සියළුම ඉන්ද්‍රියවත් ද්‍රව්‍ය භාවිතයෙන් භෝග වගාවට අත්‍යාවශ්‍ය වටිනා පැලෑටි අහාර අඩංගු කොම්පෝස්ට් සකස් කර ගත හැක. එය විද්‍යාත්මක ක්‍රියාවලියක් රැසක ප්‍රතිඵලයක් වේ.

## දින 12 ක්‍රමය — වගුව

කොම්පෝස්ට් යනු අන් කිසිවක් නොව, දිරායන ඉන්ද්‍රියවත් ද්‍රව්‍ය වේ. එය සැමට පහසුවෙන් සකසා ගත හැකි පූර්ණ පැලෑටි ආහාරයකි.

**කොම්පෝස්ට් පොහොර සාදා ගැනීම**

**දින 12 ක්‍රමය :**
**අවශ්‍ය ද්‍රව්‍ය :**

| | |
|---|---|
| නාගරික කැලිකසල, — වීථි අතුගා එකතු කරන පත්‍ර හා මල් | |
| භෝග ශේෂ — කපා ඉවත් කරන තෘණ | |
| නොමේරූ දඬු හා කොල | |
| නිසරු බිම්හි වැඩෙන පැලෑටි හා වල් වර්ග ... | %70 |
| ජලජ පැලෑටි හා ටින් කිරීමේ කර්මාන්තශාලා අප ද්‍රව්‍ය | |
| කුකුල් පොහොර — (සපයා ගත හැකි නම්) | |
| ගොවිපල් හා මස් මඩු අප ද්‍රව්‍ය | |
| මුත්‍ර මිශ්‍ර වූ පස් — (සත්ව හා මිනිස්) ... ... | 1% — 2% |
| අමු ගොම ... ... ... ... ... | 0.5% — 1% |
| බේකරි සහ මුහතැන්ගේ අළු ... ... ... | 5% |
| පැරණි කොම්පෝස්ට් ... ... ... ... | 15% — 20% |

**කඳු සෑදීම :**

මීටරයක් උසට හා මීටර දෙකක් පලලට වඩා නොවැඩි කඳු සකසා ගත යුත්තේ වාතාශ්‍රය මනාව ලැබිය යුතු බැවිනි. කන්දක දිග පිරවීමට සපයා ගත හැකි ද්‍රව්‍ය ප්‍රමාණය මත වෙනස් වේ. අම්ලකර, ජලය හා ජීවාන්තක — දිරාපත් වීමට (කුණුවීමට) උපකාරී වන සාධකයන් වේ. නිතර මේවා ලබා දිය යුතුය. මේ නිසා නිතරම තෙත් කළ යුතුය. නැතහොත් අමු කොළ මුත්‍රා මිශ්‍ර පස්, හා අමු ගොම යනාදි ද්‍රව්‍යයන් මගින් මෙම සාධකයන් සැපයිය හැකි වේ.

යොදන ද්‍රව්‍යයන්ගේ කැබලි ප්‍රමාණය කුඩා වූ තරමට ඉක්මනින් කුණු වී දිරාපත් වීම ඉක්මන් වේ. කැබලි සෙ.මී. 10 – 15 වඩා දික් නොවිය යුතුය. මේ නිසා අපද්‍රව්‍ය ඇසිරීමට පෙර කැබලි කර ගත යුතුය. පොලිතීන් හා කොහු වැනි දිරීමට අපහසු ද්‍රව්‍ය මේ සඳහා යෙදීම සුදුසු නොවේ. මනාව කලවම් කර සෙ.මී. 15 ක පමණ තට්ටුවක් ලෙස අතුරන්න. ඒ මත ජලය වත්කර නැවත මෙවැනි සෙ.මී. 15 20 තට්ටු කීපයක් යෙදීමෙන් අවශ්‍ය ප්‍රමාණයේ (කන්දක්) ගොඩක් ලබා ගත හැක. මෙවැනි ගොඩක් එක් දිනකදී සම්පූර්ණ කර ගත යුතුය.

**පළමු පෙරලීම:**

කඳු සකස් කර දින දෙකකට පසු නැවත මිශ්‍ර කළ යුතුය. කඳු පෙරලා කලවම් කිරීමේදී වට රවුමේ හා අඩියේ තැන්පත්ව තිබූ කොටස් කඳු මැදට වැටෙන සේ නැවත සකස් කළ යුතු වේ. ගව මුත්‍ර මිශ්‍ර ගොම් දියාරු පාප්පයන් සේ සාදගත් දියරයෙන් හෝ මුත්‍ර මිශ්‍ර පස් ජලය සමග මිශ්‍ර කරගත් උකු පැප්පයකින් සෑම තට්ටුවක්ම තෙත්කර නැවත ගොඩ සකස් කර ගන්න.

**දෙවන පෙරලීම:**

පළමු පෙරලීමෙන් දින 04 කට පසු හෝ කඳු ගසා දින 06 කට පසු නැවත පෙරසේ පෙරලා තට්ටු ලෙස නැවත ගොඩ ගසා සකස් කල යුතුය. එම සෑම තට්ටුවක්ට වතුරෙන් තෙත් කළ යුතුවේ.

**තෙවන පෙරලීම:**

දෙවන පෙරලීමෙන් දින 03 කට පසු හෝ කඳු සැකසීමෙන් දින 09 ගත වූ පසු නැවත පෙර සේම පෙරලීම් කර සෑම තට්ටුවකටම වතුර ඉස තෙත් කළ යුතුය.

**අවසාන පෙරලීම:**

තුන්වන පෙරලීමට දින 03 කට පසු හෝ කඳු ගසා දින 12 ක් ගත වූ පසු පෙරලන විට ද්‍රව අහ සම්හ මිශ්‍ර කරන්න. ඉන්පසු කොත් ආකාරයට ගොඩ ගසා පොල් අතුවලින් ආවරණය කර නෙත්ව තබන්න. ටෙසේ දින 12 ක් ගොඩගසා තැබීමෙන් පසුව (සකස් කර දින 24 කට පසු) කොම්පෝස්ට් වශයෙන් පාවිච්චියට ගත හැක.

(28 පිටුව බලන්න)

## කොම්පෝස්ට්. . . .

(13 වැනි පිටුවෙන්)

කාබනික ද්‍රව්‍ය පොහොර කොපමණ ප්‍රමාණයක් යෙදිය යුතුදැයි නිශ්චිතව, තීරණය කිරීම තරමක් අපහසු නමුත් දල වශයෙන් සෑම වර්ග මීටර 2 ක බිම් ප්‍රමාණයට කූඩයක් යෙදීම හෝ පැල සිටුවීමේදී වලකට පෝර කූඩා 1/3 ක් යෙදීම සෑහේ. වලවල් පිරවීම සඳහා ඉන්ද්‍රියවත් පෝර භාවිත කරන්නා වූ අවස්ථාවලදී, එම ද්‍රව්‍ය මතුපිට පස් සමඟ මිශ්‍ර කර පොලොව මට්ටමින් උස්ව සිටින සේ පිරවීම් කළ යුතුය. දින කීපයකින් මෙසේ පිර වූ පස් තැන් පත් වේ. ඉන් පසු පැල සිටුවීම කළ යුතුය.